සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 50 S I

නම: .............................................. නාට්‍ය හා රංගකලාව - I කාලය පැය තුනයි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරින් අංක 1 සිට 5 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A- ඇයිද යකුනි තොපි පෙරළි කරන්නේ
කැකෝ ගසමින් බෙරිහඬ දෙන්නේ
නිසංසලේ අපි මෙතැන සිටින්නේ
එහෙව් අපිට තොපි ඉන්ට නොදෙන්නේ

B- නමින් පසිඳු දඹදිව් තල පඩිපුර රජ කළ නිරිඳුට
යොදුන් ගණන් අඹ උයනක් විය එහි මැද සැදුනු යසට
ඇසින් බලා බැරි නිම වනු රන්කඳ වෙයි ගහෙ පාට
ගොසින් පතිනි එ අඹ ගහේ අඹයක පිළිසිඳ එම විට

C- ගව සම්පත් බෝ වේවා
ගහකොල පලදා වේවා
ගජ කුල බිය නැති වේවා
ගණදෙවි තුවණක් දේවා

D- ගුරුන්නාන්සේ - දොඩවන බාසාවක් නැද්ද කියලයි අහන්නේ.
බමුනා - දේව බාසං අත්රී මේ මනුස්සානා නත්රී
මේ තෙළිඟු බාසායං අත්රී

E- මේ පුරයේ හොර චන්ඩි බොහොම ඇත
හැන්දෑයාමේදී පාරේ තැනින් තැන
තොන්ඩි උණත් මම අම්මපා බය නැත
මෙන්න බලනවකො ඒවට දෙන වැඩ

01. ඉහත ගද්‍ය හා පද්‍ය පාඨ අතුරින් පහත රට ශාන්ති කර්මයක් හා සම්බන්ධව ඇත්තේ ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

02. ඉහත ගද්‍ය හා පද්‍ය පාඨ අතුරින් සොකරි ශාන්ති කර්මය හා සම්බන්ධව ඇත්තේ ,
1. A ය. 2. B ය. 3. C ය. 4. E ය.

03. ඉහත ගද්‍ය හා පද්‍ය පාඨ අතුරින් මඩු ශාන්ති කර්ම හා සම්බන්ධව ඇත්තේ ,
1. A ය. 2. B ය 3. C ය. 4. D ය.

04. ඉහත ගද්‍ය හා පද්‍ය පාඨ අතුරින් කෝලම් ගැමි නාටකය හා සම්බන්ධව ඇත්තේ ,
1. A ය. 2. B ය 3. D ය. 4. E ය.

05. ඉහත ගද්‍ය හා පද්‍ය පාඨ අතුරින් වේදිකා නාට්‍යක් හා සම්බන්ධව ඇත්තේ ,
1. A ය. 2. B ය. 3. C ය. 4. E ය.

★නිවැරදි වරණය තෝරන්න.

06. "නෘත්‍ය" ගණයට අයත් වන්නේ ,
1. භරත නාට්‍යම්හි රාධා ක්‍රිෂ්ණා හා ශිව පාර්වතිය. 2. ශුද්ධ මාත්‍රා, ලී කෙලි, හා තෙල්මේ ය.
3. ඔපෙරා, මුද්‍රා නාට්‍ය හා සවරං ය. 4. මණිපුරි, කථක් හා තෙල්මේ ය.

07. වේෂභූෂණ ශිල්පියාගේ වගකීම ,
1. අඩු වියදම් මත අධ්‍යක්ෂවරයාට දායක වීමයි.
2. චිත්තාකර්ෂණීය ලෙස ප්‍රේක්ෂකයා බැඳ ගැනීමට දායක වීමයි.
3. වේදිකා මායාව ප්‍රභල කිරීමට දායක වීමයි.
4. රංග රචනය ප්‍රභල කිරීමට දායක වීමයි

08. නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ ,
1. රංගාලෝකය හා පසුතල යොදා ගන්නා බැවිනි.
2.රංගාලෝකය හා ගඟනිකාව යොදා ගන්නා බැවිනි.
3. පසුතල දර්ශන සඳහා චිත්‍ර වස්ත්‍ර යොදා ගන්නා බැවිනි.
4. සතර අභිනයට රංග කාර්ය සඳහා යොදා ගන්නා බැවිනි.

09. රූපණය සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ ,
1. අනුකරණය , අනුරූපනය හා රංග ක්‍රීඩාවයි.
2. අනුකරණය , අනුරූපනය හා සමාරෝපයයි.
3. අනුකරණය , අනුරූපනය හා අංග රචනයයි.
4. අනුකරණය , අනුරූපනය හා රංගාලෝකයයි.

10. කරළිය නම් රංග භූමියේ නාට්‍යක් රඟ දක්වන විට ප්‍රේක්ෂකයින් හට නාට්‍ය ,
1. ඉදිරියේ සිට පමණක් නැරඹිය හැකිය.
2. පැති දෙකක සිට පමණක් නැරඹිය හැකිය.
3. පැති තුනක සිට පමණක් නැරඹිය හැකිය.
4. රංග භූමිය වටේම සිට නැරඹිය හැකිය.

11. වාචික අභිනය ප්‍රබල ලෙස යොදා ගන්නා ප්‍රාසාංගික කලාවක් වන්නේ ,
1. මුද්‍රා නාට්‍ය.
2. ඔපෙරා.
3. බැලේ.
4. නෘත්‍ය.

12. නාට්‍යක් රංගගත කිරීම පිණිස තිබිය යුත්තේ ,
1. වේදිකාවක් , කමතක් , කරළියක් හෝ සබයක්ය.
2. පින්තූර රාමු වේදිකාවක් , කමතක් , එරිනාවක් හා කරළියක්ය.
3. රඟ දැක්වීමට හැකි ඕනෑම ස්ථානයකි.
4. පස් වලින් ගොඩකර තැනූ වහලයක් සහිත ස්ථානයකි.

13. ටවර්හෝල් රඟහලේ පෙන්වන ලද ප්‍රථම නූර්ති නාට්‍ය වන්නේ ,
1. සිරිසඟබෝ ය.
2. සෙනගප්පු ය.
3. සකුන්තලා ය.
4. පණ්ඩුකාභය.

14. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ ,
1. යතාර්ථය ඒ ලෙසටම වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.
2. ස්වාභාවික තත්වයට ආසන්න ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමයි.
3. අතිශයෝක්තියට නගා රූපණය ඉදිරිපත් කිරීමයි.
4. චලන රටා හා වේදිකාවේ අලංකරණ අතිශයෝක්තියෙන් ඉදිරිපත් කිරීමයි.

★ පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 15 සිට 19 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/ අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| රූඩන්ස් | ප්ලෝටස් | කඹය | ක |
| රන්හෝ යුවර් වයිෆ් | රේ කැනි | ග | බන්දුල විතානගේ |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | ජ | හිත හොඳ අම්මණ්ඩි | සුගතපාලද සිල්වා |
| ට | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසි විලියම්ස් | අහස් මාලිගා | ඩ |

15.ඉහත වගුවේ' ක' කොටුවට ඇතුලත් විය යුතු මෙරට අධ්‍යක්ෂකගේ නම කුමක්ද?
1. බන්දුල ජයවර්ධන.
2. පරාක්‍රම කිරිඇල්ල.
3. ධම්මජාගොඩ.
4. රංජිත් ධර්මකීර්ති.

16. ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුලත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?
1. මකරාක්ෂයා.
2. රෝමය ගිනිගනී.
3. සයුරෙන් ආ ලඳ.
4. බෙර හඬ.

17.ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුලත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
1. නිකලොයි ගොගොල්. 2. බර්නාඩ් ෂෝ. 3. බර්ටෝල් බ්‍රෙෂ්ට්. 4.ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව්.

18.ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුලත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?
1. ද එල්ඩර් සන්. 2. ද ලෝවර් ඩෙප්ත්ස්. 3. ද පබ්ලික් එනිමි. 4. යෙර්මා.

19.ඉහත වගුවේ 'ඩ' කොටුවට ඇතුලත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක්ද?
1. සුනන්ද මහේන්ද්‍ර. 2. හෙන්රි ජයසේන. 3. ජයලත් මනෝරත්න. 4. එදිරිවීර සරච්චන්ද්‍ර.

20. නාඩගම් සඳහා ආලෝකය ලබා දුන් පහන් විශේෂය වන්නේ,
1. විදුලි පහන්. 2. කිට්සන් පහන්. 3. දුම් ලාම්පු. 4. විදුලි පන්දම්.

21.නලු නිළියන් වේදිකා අවකාශයෙහි චලන රටා ඇති කරවීම.
1. අංග රචනය යි. 2. නර්තන රචනය යි. 3. වේදිකා රචනය යි. 4. රංග රචනය යි.

22. වේදිකා නාට්‍යක නාට්‍යෝපකරණ සැලසුම් කිරීමේදී
1. බාහිර ලෝකයේ ඇති භාණ්ඩ වලට වඩා විශාල විය යුතුයි. 2. මට සිලිටු හා අඩු වියදමින් විය යුතුයි.
3. සැබවින්ම චිත්තාකර්ෂනීය විය යුතුය. 4. නාට්‍යයේ ක්‍රියාවලිය හා බැඳී පැවතිය යුතුයි.

23. හිම කන්ද දියවීමේ අභ්‍යාසය ,
1. ශිතිලකරණ අභ්‍යාසයකි. 2. ස්වසන අභ්‍යාසයකි. 3. තාපන අභ්‍යාසයකි. 4. සංවේදන අභ්‍යාසයකි.

★ පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 24-27 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

24. මෙහි 'ක' ඡායා රූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ ,
1. රංජිත් ධර්මකීර්ති. 2.සුගතපාල ද සිල්වා. 3. ධර්මසිරි බණ්ඩාරනායක. 4. පරාක්‍රම නිරිඇල්ල.

25. මෙහි 'ග' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ ,
1. සුනන්ද මහේන්ද්‍ර. 2. එස්. මෞනගුරු. 3. සයිමන් නවගත්තේගම. 4. ආර් . ආර්. සමරකෝන්.

26. 'මරාසාද්' වේදිකා නාට්‍ය හා සම්බන්ධ දෙපළ සඳහන් ඡායාරූප වන්නේ ,
1. ක හ ජ ය. 2. ග හා ට ය. 3. ක හා ට ය. 4. ග හා ජ ය.

27. මෙහි 'ජ' හා 'ට' ඡායාරූප වලින් දැක්වෙන රූපණ ශිල්පීන් දෙදෙනා පිළිවෙලින් ,
1. මැණිකේ අත්තනායක හා චාන්දනී සෙනෙවිරත්නය. 2. දීපානි සිල්වා හා රම්‍යා වනිගසේකර.
3. මාලතී රණසිංහ හා කෞෂල්‍යා ප්‍රනාන්දු. 4. කෞෂල්‍යා ප්‍රනාන්දු හා මැණිකේ අත්තනායක.

28. මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදා ගත් නාට්‍ය විශේෂය ,
1. කෝලම් ය. 2. සොකරි ය. 3. නාඩගම් ය. 4. නුර්ති ය.

29. රංග රචනා ශිල්පයෙහි වඩාත් ප්‍රකට වන්නේ ,
1. ඉන්ද්‍ර ධර්මසේනය. 2. ජෙරම් ද සිල්වාය 3. රුවන්ති ද චිකේරාය. 4. මාර්ක් ඇන්ටනිය.

30. නළු වරණය මඟින් සිදු කළ යුත්තේ ,
1. ජනප්‍රිය නළු නිළියන්ව තෝරා ගැනීමයි. 2.හිතවත්කම අනුව නළු නිළියන්ව තෝරා ගැනීමයි.
3. ගායන හැකියාව අනුව පමණක් තෝරා ගැනීමයි. 4. ඒ ඒ චරිතයට ගැලපෙන අය පමණක් තෝරා ගැනීමයි.

31.දික්තලා කාලගෝල නාට්‍යයේ චරිත වේෂභූෂණ නිර්මාණය කර ඇත්තේ ,
1. ජාතක කතා වල සඳහන් විස්තර වලට අනුවය. 2. ලෝක ධර්මී රංග ශෛලියට අනුවය.
3. නුර්ති රංග ශෛලියට අනුවය. 4. නාට්‍ය ධර්මී රංග ශෛලියට අනුවය.

32. කෙටි නාට්‍යක් යනු බොහෝ විට ,
1. දිගු නාට්‍යක ජවනිකා කෙටිකර පෙන්වීමකි. 2. දිගු නාට්‍යක ජවනිකා අඩු කර පෙන්වීමකි.
3. ඒකාංග නාට්‍යකි. 4. චරිත දෙකක් පමණක් ඇති නාට්‍යයකි.

★පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ඇසුරින් අංක 33 සහ 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


ක



ග

33.මෙහි දැක්වෙන වෙස් මුහුණු දෙක,
1. 'ක' සන්නි මුහුණකි. 'ග' කෝළම් මුහුණකි.
2. 'ක' හා 'ග' කෝළම් මුහුණු දෙකකි.
3. 'ක' කෝළම් මුහුණකි.'ග' සන්නි මුහුණකි.
4. 'ක' හා 'ග' සන්නි මුහුණු දෙකකි.

34. මෙම වෙස් මුහුණු දෙක ,
1. 'ක' ආරච්චි කෝළම හා 'ග' පොළිස් කෝළමයි.
2. 'ක' අමුක්කු සන්නිය හා 'ග'ආරච්චි කෝළමයි.
3. ක' ආරච්චි කෝළම හා 'ග' කණ සන්නියයි.
4. 'ක' අමුක්කු සන්නිය හා 'ග' කණ සන්නියයි.

35. නාට්‍යමය අවස්ථාවක් යනු ,
1. යම්කිසි කතා පුවතක් ඒ අයුරින්ම නිරූපණය කිරීමයි.
2. යම්කිසි කතා පුවතක් රසවත්ව නිරූපණය කිරීමයි.
3. සමාන අදහස් ඇති චරිතවල හැඟීම් නිරූපණය කිරීමයි.
4.යම්කිසි ගැටුමක් සහිත සිද්ධියක් නිරූපණය කිරීමයි

★ ප්‍රශ්න අංක 36 සහ 37 සඳහා නොගැලපෙන පිළිතුර තෝරන්න.

36. නූර්ති නාට්‍ය වලදී ,
1. එල්ෆින්ස්ටන් රඟහල භාවිත විය.
2. මුල්ම සිංහල නූර්තිය රොලිනා විය.
3. ජනප්‍රිය නූර්ති රචකයා වූයේ ජෝන්ද සිල්වාය.
4. කුස ජාතකය, පද්මාවති නූර්තින් චාල්ස් ඩයස්ගේය.

37.රංග අභ්‍යාස වල නිරත වීමෙන් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ ලෙස ,
1. ශරීරය නමනීය කර ගැනීමට හැකිවේ.
2. සිරුර ස්ථූල කර ගැනීමට හැකිවේ.
3. සබකෝලය දුරු කර ගැනීමට හැකිවේ.
4. හඬ තීව්‍ර කර ගැනීමට හැකිවේ.

38.රූපණ ශිල්පියෙකුට දෑස්වල සබඳතාවය පවත්වාගැනීම ඉතා වැදගත්ය.මේ සඳහා ප්‍රගුණ කළ යුතු අභ්‍යාසයකි.
1. ශිථිලකරණ අභ්‍යාස.
2. සංවේදන අභ්‍යාස.
3. තාපන අභ්‍යාස.
4. දර්පණ අභ්‍යාස.

39. නාට්‍ය පෙළ රංගනයක් බවට පත් කිරීමේ පුරෝගාමී වන්නේ ,
1. අනුෂංගික ශිල්පීන් ය.
2. නිෂ්පාදක ය.
3. අධ්‍යක්ෂක ය.
4. වේදිකා පාලක ය.

40. වඩාත් ගැළපෙන සම්බන්ධතාවය දැක්වෙන පිළිතුර තෝරන්න.
1. මුද්‍රා නාට්‍ය - සංගීතය 2. ගීත නාට්‍ය - සංවාද 3. ඔපෙරා - නර්තනය 4. බැලේ - නර්තනය

අවසාන වාර පරීක්ෂණය-2023
නාට්‍ය හා රංග කලාව -2 කොටස

● පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. විකෘති නාට්‍යය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
i. විකෘති නාට්‍යය කවර සියවසේ කවර දශකයේ දී නිර්මාණය වූවක්ද? (ලකුණු 02)
ii. එම නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. මෙම නාට්‍යයේ ආර්ථික දරිද්‍රතාවය හමුවේ ඛේදවාචකයට මුහුණ දෙන පිරිමි චරිතයක් නම් කරන්න.(ලකුණු 02)
iv. ප්‍රියංගනීගේ හැකියාවන් සහ අපේක්ෂාවන් හඳුනාගෙන ඇයව ඒ සඳහා යොමු කිරීමට උත්සහ ගනු ලබන්නේ කවුරුන් විසින්ද?
එම චරිතයේ නම කුමක්ද? (ලකුණු 02)
v. මෙම නාට්‍යයේ භාවිත කරනු ලබන අනුෂාංගික කලා දෙකක් නම් කරන්න. (ලකුණු 02)
vi. විකෘති නාට්‍ය පෙළ රචනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

02. i. මුල්ම සිංහල නාඩගම සහ එහි රචකයා නම් කරන්න. (ලකුණු 02)
ii. නාඩගම් ශිල්පීන් දෙදෙනෙකු නම් කර ඔවුන්ගේ නිර්මාණ දෙකක් පිළිවෙලින් ලියන්න. (ලකුණු 04)
iii. නාඩගම් රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. රංගභූමියේ භූගෝලීය බෙදීම අනුව කොටස් කීයකට බෙදා දැක්වේද? (ලකුණු 02)
ii. එම බෙදීම රූප සටහනක් ඇඳ නම් කරන්න. (ලකුණු 04)
iii. රංගභූමියක තිබිය යුතු ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 06)

04. i. කොහොඹා කංකාරිය ශාන්ති කර්මය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. කොහොඹා කංකාරියේ එන නාට්‍යයම ලක්ෂණ අන්තර්ගත රංග අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 04)
iii. ඉහත ii හි සඳහන් කරන ලද රංග අවස්ථාවන්හි දක්නට ලැබෙන නාට්‍යයමය ලක්ෂණ මොනවාදැයි විමසන්න. (ලකුණු 06)

05. i. රංගාලෝකය සපයා ගැනීමට අතීතයේ භාවිතා කළ උපක්‍රමණ මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 02)
ii. රංගාලෝක පහන් වර්ග හා උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 04)
iii. වේදිකා නාට්‍යයකට රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි ?නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංග ක්‍රමය වෙනස් කර ජන කරළිය ජංගම රඟ මඬල ආරම්භ කිරීම සඳහා පුරෝගාමී වූ නාට්‍ය වේදියා නම් කරන්න. (ලකුණු 02)
ii. ජනකරළිය ජංගම රඟ මඬල ආරම්භ කිරීමත් සමඟ නිෂ්පාදනය කළ නාට්‍ය 04 ක් නම් කරන්න. (ලකුණු 04)
iii. දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට ඔහුගෙන් සිදුවූ සේවාව. (ලකුණු 06)

07. පහත දැක්වෙන කතා සැලකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කර ගත හැකිය.

අහස කළු වී මහ වැස්සක් ඇඳ හැලෙන්න ලං වෙත්ම පන්තියේ වැඩ නිමාවී නිවසට යාමේ බලාපොරොත්තු වෙන් කසුන් , නිමල් ,අමාලි බස් නැවතුම්පල අසලට පැමිණියේය. බස් නැවතුමේ ඉතා හැඩට ඇඳගත් කඩවසම් තරුණයෙක් ජංගම දුරකථනයෙන් ගීතයක් අසමින් ඒ දෙස දෑස් යොමු කර සිටී. දුරකථනය හා වයරය ඔහුගේ සවනේ රැදි ඇති ආකාරයද දැක ගැනීමට හැකිවේ. මඳ වේලාවක් ගත වෙනවාත් සමගම ඔහු දෙසින් දුමාරයක් පිටවෙනවාත් සමඟ එළියක් පත්තු විය.

i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා. (ලකුණු 04)
ii. සංවාද හා රංග විධාන සහිත රචනා කිරීම. (ලකුණු 04)
iii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩ නැගිම සඳහා. (ලකුණු 04)

අවසාන වාර පරීක්ෂණය -2023
(50) නාට්‍ය හා රංග කලාව-ප්‍රායෝගික පරීක්ෂණය

11 ශ්‍රේණිය කාලය- පැය 1 යි.

ඇගයීම 01

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

- ලෝක ධර්මී සංවාද සහිත පෙළ දෙකක්ද නාට්‍ය ධර්මී සංවාද සහිත පෙළ දෙකක්ද ඇසුරින් මෙම ඇගයීම සිදු කරනු ලැබේ.
  1. ශිෂ්‍යයා විසින් තෝරා ගනු ලබන පුහුණු වී පැමිණෙන විකෘති හෝ දික්තල කාලගෝල යන නාට්‍ය දෙකින් එකක කොටසක්.
  2. පරීක්ෂක මණ්ඩලය විසින් තෝරා දෙනු ලබන මනමේ හෝ තල මල පිපිලා යන නාට්‍ය දෙකින් එකක කොටසක් විය යුතුය. මෙහිදී ශිෂ්‍යයා විසින් පුහුණු වී පැමිණ ඇත්තේ නාට්‍ය ධර්මී සංවාද කොටසක් සහිත දික්තල කාලගෝල නාට්‍යයේ කොටසක් සඳහා නම් ගුරුවරයා විසින් ලබා දිය යුත්තේ තල මල පිපිලා නාට්‍යයේ සංවාද සහිත දෙබසකි.ශිෂ්‍යයා පුහුණු වී පැමිණ ඇත්තේ විකෘති නාට්‍යයේ කොටසක් සඳහා නම් ගුරුවරයා ලබා දිය යුත්තේ මනමේ නාට්‍යයෙන් සංවාද සහිත කොටසකි. (එක් කොටසකට විනාඩි 02 බැගින් කාලය විනාඩි 04 කි) (ලකුණු 20)

ඇගයීම 02

- ක්ෂණික නිරූපණය (කේවල)
  විනාඩි 03 ක උපරිම කාලයක් ලබා දිය යුතුය.
- මෙහිදී ලබා දී ඇති මාතෘකා ගුරුවරයා විසින් සුදුසු නාට්‍යානුසාරී සිදුවීමක් ගොඩ නැංවිය හැකි ලෙසින් යම් සුළු වෙනසක් කිරීමක් සිදු කර දිය යුතුය. පහත දී ඇති තේමාවක් ශිෂ්‍යයන්ට අහඹු ලෙස තෝරා ගැනීමට ඉඩ ලබාදෙන්න.ඉන් පසු අහඹු ලෙස තෝරා පරීක්ෂක මණ්ඩලය වෙත අපේක්ෂකයා ලබා දුන් මාතෘකාවට ගුරුතුමිය විසින් සුදුසු නාට්‍ය කොටසක් එකතු කර ශිෂ්‍යයාට ලබා දෙන්න.

1. අධික වැසි සහිත රාත්‍රියක ..........................
2. ගං ඉවුරේ මසුන් අල්ලමින් සිටින විට.............
3. මංගල උත්සවයකට යාමට සැරසී සිටින විට............
4. පිස්සන් කොටුවෙන් පැන ආ සරත්/මිහිරි.................
5. දිය නාමින් සිටින විට කරාමයේ වතුර.......................
6. පාසල් ඇරී එන විට පිස්සු බල්ලෙක්..........................
7. මළ ගෙදරට ජනප්‍රිය නළුවෙකු...................................
8. පන්සලේ කඨින පිංකම සිදු කරමින් සිටින විටදී .........
9. වැසි දිනකදී බැගයේ තිබූ කුඩය නැතිවී ..................
10. අලුත උපන් මල්ලී ගෙදර රැගෙන එන පළමු දවසේ ...........

මෙම මාතෘකා දහය ඇසුරෙන් නාට්‍යමය අවස්ථාවක් ගොඩ නැගෙන ලෙස සකස් කර අපේක්ෂකයාට ලබා දෙන්න.
(ලකුණු 15)

ඇගයීම 03

කෙටි නාට්‍ය නිෂ්පාදනය- සාමුහික
කාලය විනාඩි 06-08 අතර වේ.

- පන්ති කාමරයේදී නිර්මාණය කරනු ලැබූ කණ්ඩායම් ක්‍රියාකාරකමක් වන අතර නාට්‍ය පෙළක් සහිත විය යුතුය.
  මෙම කණ්ඩායම් ඇගයීමට ශිෂ්‍යයන් 04-07 පමණ සිටීම ප්‍රමාණවත්ය.එහෙත් ශිෂය සංඛ්‍යාව අඩු අවස්ථා වලදී එය වෙනස් විය හැකිය. පිටපතට අනුකූලව විය යුතුයි.නාට්‍යෝපකරණ, වේෂ භූෂන, සංගීතය භාවිතයට ඉඩ ඇත. ස්ථානීය වශයෙන් සරල සහ අත්‍යවශ්‍ය පසුතල පමණක් භාවිතා කළ හැකිය. විනාඩි 10 ට සීමා කරන්න. (ලකුණු 20)

ඇගයීම 04

නාට්‍ය ගීතය-(කේවල)

- ශිෂ්‍යයා අභිමත ඕනෑම නාට්‍යය ගීතයක් ගයමින් හා රඟමින් සිදු කරනු ලබන්නකී.කාලය විනාඩි 03කි.
  නාඩගම් සම්ප්‍රදායේ පටන් නූතන යුගය දක්වා වන ඕනෑම නාට්‍ය සාම්ප්‍රදායකින්/ශෛලයකින් තෝරා ගත් නාට්‍යය ගීතයක් විය හැකිය.මුවින් ගායනා ගීතයක් විය යුතු අතර පසුබිමේ ගීතයක් නොවිය යුතුය. (ලකුණු 15)

ඇගයීම 05

නිර්මාණාත්මක රංග රචනය(සාමුහික) කාලය විනාඩි 2-4 විය යුතුයි.
පූර්ව සූදානමක් සහිතයි.

- සංගීත හඬ පටයක් අනුව විනාඩි 2-4 දක්වා වූ වාචික අභිනයෙන් තොර ඉදිරිපත් කිරීමකි. ශිෂ්‍යයන් ප්‍රමාණය 3-5 අතර වේ. රංග රචනය කේන්ද්‍ර වන අතර හුදු නර්තනයෙන් ඔබ්බට ගොස් සිදු කරනු ලබන නාට්‍යාමය ඉදිරිපත් කිරීමකි. මෙවර අ.පො.ස (සා.පෙ) විභාගය සඳහා අන්තර් ජාලයේ ප්‍රසිද්ධ කරන ලද සංගීත ඛණ්ඩයක් ගෙන් එකක් විය යුතුය.
  (ලකුණු 15)

ඇගයීම 06

කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම. කාලය විනාඩි 3 -5 විය යුතුය.

- ශිෂ්‍යයා තෝරා ගත් සාම්ප්‍රදායක හෝ දෙස් විදෙස් ජනකතා/සුරංගනා කතා/උපමා කතා හෝ වෙනත් සුදුසු කතාවකි. නාට්‍යෝපකරණ , වේෂ භූෂණ මෙන්ම ස්ථානීය වශයෙන් භාවිතා කළ හැකි පසුතල භාවිතයට ඉඩදෙන ඇතැම් විට සංගීත ශබ්ද සංයෝජනයට රූකඩ භාවිතය වැනි දේ යොදා ගැනීම ගැටළුවක් නොවේ.
  (ලකුණු 15)